(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 9.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2020 පෙබරවාරි 05 වැනි බදාදා අ.භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ සබඳතා අමාත්‍යතුමා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමා සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්ද මහතා,** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික

සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා සහ කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිළුම් අමුණුගම මහතා,** ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** දේශීය වෛද්‍ය සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** ඉඩම් හා ඉඩම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී සම්පත් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත පෙරේරා මහතා,** ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** ජාත්‍යන්තර සහයෝගීතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** දුම්රිය සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සංවර්ධන බැංකු හා ණය යෝජනා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** වරාය සංවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **ජෝන් අමරතුංග මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **වසන්ත අලුවිහාරේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **මනෝ ගනේසන් මහතා**

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **පියසේන ගමගේ මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **අනුරාධ ජයරත්න මහතා**

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**

ගරු **ප්‍රේමලාල් ජයසේකර මහතා**

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය**

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා
ගරු මුහම්මදු නසීර් මහතා
ගරු එස්. බී. නාවින්න මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා
ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු තිලක් මාරපන මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු සමන් රත්නප්‍රිය මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා

**ගරු රන්ජන් රාමනායක මහතා**
**ගරු වරුණ ලියනගේ මහතා**
**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**
**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
**ගරු චමින්ද විජේසිරි මහතා**
**ගරු ධුලිප් විජේසේකර මහතා**
**ගරු හේෂා විතානගේ මහතා**
**ගරු තේනුක විදානගමගේ මහතා**
**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
**ගරු කුමාර වෙල්ගම මහතා**
**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
**ගරු සන්දිත් සමරසිංහ මහතා**
**ගරු ඊ. සරවනපවන් මහතා**
**ගරු මුත්තු සිවලිංගම් මහතා**
**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**
**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
**ගරු සුජීව සේනසිංහ මහතා**
**ගරු වසන්ත සේනානායක මහතා**
**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**
**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**
**ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා**
**ගරු රවුෆ් හකීම් මහතා**
**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**
**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
**ගරු ඩී. බී. හේරත් මහතා**
**ගරු විජිත හේරත් මහතා**
**ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා**
**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්
නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්
කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්
ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම :** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ තෝරා පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු වැලිගොඩගේ සමන් රත්නප්‍රිය සිල්වා මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සභා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේය.

**2. කථානායකවරයාගේ නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 වර්ෂයේ දී සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සම්බන්ධව විමර්ශනය කර ඒ සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීමට පත් කරන ලද විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි, අදාළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳව පිළියෙළ කරන ලද වෝහාරික විගණන වාර්තාව පාර්ලිමේන්තුවේ සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම පිණිස 2020 ජනවාරි 21 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. එනමුදු මෙම වාර්තාවට අදාළ ඇමුණුම් සහ ඉදිරිපත් කිරීම් ලබා දී නොමැති බැවින්, ඒවා ලබා දෙන ලෙස මවිසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව බැඳි වෙළුම් 56කින් යුතු (පිටු 10,000කට අධික) මෙම වෝහාරික විගණන වාර්තාවේ ඇමුණුම් සහ ඉදිරිපත් කිරීම් අඩංගු සංයුක්ත තැටි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීන් වෙත ලබා දීම පිණිස පාර්ලිමේන්තු පුස්තකාලයේ තබා ඇති බවත්, එහි මුද්‍රිත පිටපත් 3ක් ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පරිශීලනය සඳහා පාර්ලිමේන්තු පුස්තකාලයේ තබා ඇති බවත්, දැනුම් දීමට කැමැත්තෙමි.

කලින් ඉදිරිපත් කරන ලද මෙම වෝහාරික විගණන වාර්තාවේ සහ පසුව ඉදිරිපත් කරන ලද ඇමුණුම් හා ඉදිරිපත් කිරීම්වල යම් යම් තැනැත්තන්ගේ පෞද්ගලික සහ රහස්‍ය තොරතුරු ඇතුළත් වන බැවින්, ඒවා සුපරික්ෂාකාරීව හා වගකීමෙන් යුතුව පරිශීලනය කරන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි."

**II**

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(1)හි විධිවිධාන ප්‍රකාරව, 2020 ජනවාරි 24 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි:—

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
ගරු ඩග්ලස් දේවානන්ද මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු දුමින්ද දිසානායක මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා"

## III

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1) හි විධිවිධාන ප්‍රකාරව, 2020 ජනවාරි 24 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි:—

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
ගරු ඩී. වී. චානක මහතා"

## IV

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121හි විධිවිධාන සහ 2020 ජනවාරි 24 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ගරු එම්. ඒ. සුමන්තිරන් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි:—

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
ගරු රංජිත් සියඹලාපිටිය මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු (ආචාර්ය) එස්.එම්. මොහමඩ් ඉස්මායිල් මහතා"

**V**

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 11(21) සහ (22)(අ) හි විධිවිධාන ප්‍රකාරව, 2020 ජනවාරි 24 වැනි දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වරුණ ලියනගේ මහතා නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්, 2019 අංක 6 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2019.12.01 සිට 2019.12.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන පිළිගන්වා, එම පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යවරිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරිය විසින්, 2018 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යවරිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරිය විසින්—

(i) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3(ඕ) වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සායනික පරීක්ෂණ සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 21 දිනැති අංක 2146/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

පිළිගන්වා, එම නියෝග සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) 2018 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(iii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන;

(v) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(vi) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(viii) 2018 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(x) 2018 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට 2019 සැප්තැම්බර් 24 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස බී. අසෝක කීර්ති ද සිල්වා මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 2142/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(xii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ, තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස ආචාර්ය නවරත්නගේ සුනිල් ජයන්ත නවරත්න මහතා පත් කිරීම සම්බන්ධයෙන් සහ 2019 නොවැම්බර් 07 දිනැති අංක 2148/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පරිච්ඡින්න කරමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජනවාරි 03 දිනැති අංක 2156/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම වාර්තා සහ නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා සහ කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යවරයා විසින්, 2013/2014, 2014/2015 සහ 2015/2016 වර්ෂ සඳහා බී. සී. සී. ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 2143/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය පිළිගන්වා, එම නියෝගය ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (i) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ නියමයන්;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ නියමයන්;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නියමයන්; සහ

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 137 වගන්තිය යටතේ රීති

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(ii) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු ලසන්ත අලගියවන්න මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද:—

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ නියෝග;

(ii) 2016 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(අ.භා. 2.48 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

**5. ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) :** අග්‍රාමාත්‍යවරයා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යවරයා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2020 පෙබරවාරි 18 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) :** අග්‍රාමාත්‍යවරයා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යවරයා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2020 පෙබරවාරි 18 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**7. ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව** : පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, නියෝජ්‍ය කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දහහතර දෙනෙකුගෙන් (14) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1) :** ගරු එස්. එම්. මරික්කාර් මහතා, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා හෞතචිකිත්සක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරිය වෙත පවරන ලදී.

**9. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2) :** ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය, ගරු ආනන්ද අලුත්ගමගේ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ඉඩම් සංවර්ධන ආඥාපනත (464 වන අධිකාරය) සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වෙත පවරන ලදී.

**10. මෝටර් වාහන පනත යටතේ නියෝග :** ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (203 අධිකාරය) මෝටර් වාහන පනතේ 164 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ සලකුණු, සංඥා, සංකේත සහ මාර්ග ලකුණු කිරීම් සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජුනි 18 දිනැති අංක 2128/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.09.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

"ගරු තේනුක විදානගමගේ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, දුම්රිය සේවා රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.00 ට ගරු තේනුක විදානගමගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.05 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ඩී. වී. චානක මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.40 ට ගරු ඩී. වී. චානක මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම (වැවිලි කර්මාන්තයට රාජ්‍ය මැදිහත්වීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.48 ට, 2020 පෙබරවාරි 06 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.